සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක :-30/2026

මගේ අංකය:- PPSC/ES/07/FI/06/03-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය, රත්නපුර.
2026.08. 4

සබරගමුව පළාත් සභාවේ,

01. ලේකම්,පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා අමාත්‍යාංශය
02. කොමසාරිස්, පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව

**සබරගමුව පළාත් පරිවාස,ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ**
**II ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026**

සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

02. මෙම පළාත් රාජ්‍ය සේවයේ II ශ්‍රේණියේ තනතුරු දරන්නා වූ සමාජ සේවා නිලධාරීන්, ස්වකීය අයදුම්පත් තමාගේ පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන කාර්යාලයේ ප්‍රධානියා වෙත භාර දී **2026.08.28** දින නොඉක්මවා මෙම කොමිෂන් සභා කාර්යාලයට ලැබීමට සැළැස්විය යුතුය.

03. අයදුම්පත් මෙම චක්‍රලේඛය සමඟ එවා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කර ගත් ඒවා විය යුතු අතර එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. එම අයදුම්පත්‍රය A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 04 දක්වා පළමු පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි පිළියෙළ කළ යුතුය. සබරගමුව පළාත් පරිවාස,ළමාරක්ෂක හා සමාජ සේවා කොමසාරිස් විසින් තමාට ලැබෙන අයදුම්පත් එකම ආවරණ ලිපියක් මඟින් **2026.08.28** දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

04. විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් යුක්ත වූ ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වන අතර, මෙම කාර්යාලය විසින් ඉදිරියේදී පවත්වනු ලබන දෙමළ භාෂා වාචික පරීක්ෂණයකට ද පෙනී සිටිය යුතු වේ. ප්‍රශ්න පත්‍ර තුනම සහ දෙමළ භාෂා වාචික පරීක්ෂණය සමත් වූ පසු සමස්ථ විභාගය සමත් වූවා සේ සැලකේ.

| **විෂය අංකය** | **විෂයය** | **කාලය** | **මුළු ලකුණු** |
|---|---|---|---|
| 01 | ආයතන සංග්‍රහය<br>**(I, II , III, IV,V, VII, XII, XIV, XVI, XVII, XXIII, XXIV, XXVII, XXVIII, XXX, XXXII, )** යන පරිච්ඡේද සහ ආයතන සංග්‍රහයේ II කාණ්ඩය | පැය 02 | 100 |
| 02 | මුදල් රෙගුලාසි<br>**( I - VII දක්වා පරිච්ඡේද )** | පැය 02 | 100 |
| 03 | විෂයානුබද්ධ දැනුම<br>වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධ ප්‍රතිපත්තීන්. චක්‍රලේඛ හා උපදෙස් ලිපි. හදිසි ආපදා තත්ත්වයන් සම්බන්ධව පළකර ඇති චක්‍රලේඛ හා උපදෙස් ලිපි, සමාජ ආරක්ෂණය සම්බන්ධ විධි විධාන, ක්ෂේත්‍ර අධ්‍යයනයන් . පසු විපරම, සමාජ ගැටළු හා ව්‍යුහය ආදී විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 |

❖ සාමාර්ථය ලැබීමට එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතු වේ.

05. **විභාග ගාස්තු** - පළමු වරට මෙම විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුවෙන් නිදහස් කෙරේ. විෂයයන් තුන සඳහාම නම් විභාග ගාස්තුව රු.600/- ක් ද, එක් විෂයයක් සඳහා නම් රු.250/- ක් ද, ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව මෙම පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) කලාප අධ්‍යාපන කාර්යාලයකට හෝ සබරගමුව පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එසේ ගෙවන විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99 ආදායම් ශීර්ෂයට බැරවන සේ ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පසුපිටෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ප්‍රාදේශීය ලේකම්වරු එම විභාග ගාස්තු අය කිරීමේදී එම මුදල් මෙම පළාත් සභාවේ ඉහතින් සඳහන් ආදායම් ශීර්ෂයට බැර කිරීම සඳහා ක්‍රියා කළ යුතු බවද මෙහිලා විශේෂයෙන් ම සඳහන් කරමි.)

06. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපිය ඔබ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සිටින සියළුම II ශ්‍රේණියේ තනතුරු දරන්නා වූ පරිවාස නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා වහාම යොමුකරන්න. මෙම විභාගය 2026 සැප්තැම්බර් මස පැවැත්වීමට අපේක්ෂිතය.

07. මෙම චක්‍රලේඛයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

එස්.පී.කේ.බෝධිමාන්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් පරිවාස,ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරින් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026**

First Efficiency Bar Examination Prescribed for Social Service Officers in grade II of the Department of Probation,Childcare & Social services, Sabaragamuwa Province – 2026

01. (අ) මුලකුරු සමඟ නම:-..........................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න. උදා:- SILVA A.B.)

(ආ) සම්පූර්ණ නම :-..........................................................................................................................

(ඇ) මුලකුරු සමඟ නම:-..........................................................................................................................

(ඇ) රාජකාරී ලිපිනය:-..........................................................................................................................

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(ඉ) ස්ත්‍රී / පුරුෂ භාවය:-..........................................................................

(ඊ) ඉදිරිපත් වන විෂය/ විෂයයන්:-

| විෂය | විෂය අංකය |
|---|---|
| ............................................................ | ............ |
| ............................................................ | ............ |
| ............................................................ | ............ |
| ............................................................ | ............ |
| ............................................................ | ............ |

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. (අ) ඔබ සමාජ සේවා නිලධාරී II ශ්‍රේණියට පත් වූ දිනය:-....................................................................

(ආ) 2026.08.28 දිනට එම ශ්‍රේණියේ සේවා කාලය:-....................................................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බවද ප්‍රකාශ කරමි.

දිනය:- ..............................................................

අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන

---

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................................................................ මහතා / මහත්මිය / මෙනවිය .................................. දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

දිනය:- ..............................................................

අත්සන සහතික කරන්නාගේ අත්සන

සටහන:- තමා සේවය කරන කාර්යාලයේ ප්‍රධානියා විසින් අත්සන සහතික කිරීම කළ යුතුය.

---

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන**

ඉහත අංක 01 සිට 04 දක්වා වූ තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට / අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය:-

..............................................................

පදවි නාමය:- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න.)